**සිංහල පරිවර්තනය**

# උතුරු පළාත් රාජ්‍ය සේවයේ ඉඩම් ක්ෂේත්‍ර උපදේශක III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවාත තරග විභාගය - 2021

උතුරු පළාත් රාජ්‍ය සේවයේ ඉඩම් ක්ෂේත්‍ර උපදේශක IIIවන ශ්‍රේණියේ තනතුරට පවතින පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් පැවැත්වීමට නියමිත බව දන්වනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **20.04.2021** වේ.

## 02. බඳවා ගැනීමේ සේවා කොන්දේසි :-

*2013.01.01* වන දින සිට බලාත්මක වන පරිදි උතුරු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් විසින් අනුමත කරන ලද **ඉඩම් ක්ෂේත්‍ර උපදේශක** සේවයේ සේවා ව්‍යාවස්ථා සංග්‍රහය මගින් නිර්දේශ කරන ලද කොන්දේසීන් හා එහි සංශෝධනයන්ට ද අනුකූලව, ආයතන සංග්‍රහයේ විධිවිධානයන් ද, මුදල් රෙගුලාසීන් හා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක**1817/30** හා **2013.07.03**වන දින දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයේ පළ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවයේ ආයතන කාර්ය පටිපාටි සංග්‍රහය යනාදීන් ට යටත්ව, තෝරා ගන්නා අපේක්ෂකයන් අදාළ තනතුරේ III වන ශ්‍රේණියට පත් කිරීමට නියමිතය.

*02.1* විවෘත තරග විභාගය සමත් වී පත්වීමට තෝරා ගන්නා අපේක්ෂකයන් පත්වන දින සිට අවුරුදු තුනක් පරිවාස කාලයට යටත් කර පත් කරනු ලැබේ. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරකි. සේවා ව්‍යාවස්ථා සංග්‍රහයේ සඳහන් වන පරිදි උතුරු පළාත් **ඉඩම් ක්ෂේත්‍ර උපදේශක** III වන ශ්‍රේණියට පත් කළ දින සිට අවුරුදු *03* ක් ඇතුළතදී පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත් විය යුතුයි.

02.2 මෙම සේවය ස්ථාන මාරුවලට යටත් වූ සේවයකි. එබැවින් මෙම පත්වීම ලබා ගන්නා අපේක්ෂකයන් උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයට සේවය කිරීමට බැඳී සිටිය යුතුයි. මෙම නියෝගයට නැමුරුව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුයි.

02.3 පත්වීම් සංඛ්‍යාව හා එය ක්‍රියාත්මක වන දිනය වැනි කරුණු යනාදිය පත්වීම් බලධාරියා විසින් නිර්වචනය කරනු ලැබේ. නිවේදනය කරන ලද යම් පුරප්පාඩුන් හෝ පුරප්පාඩු සියල්ල සම්පූර්ණ නොකර සිටීමේ බලතල පත්වීම් බලධාරියා සතුය. පත්කිරීමට නියමිත සංඛ්‍යාව *12* කි.

## 03. වැටුප් පරිමාණය :-

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක *03/2016* පරිදි, වැටුප් කාණ්ඩය **MN 1 – 2016** අනුකූලව **ඉඩම් ක්ෂේත්‍ර උපදේශක** III වන ශ්‍රේණියේ තනතුරට අදාල ඒකාබද්ධ වැටුප් පරිමාණය රුපියල් **27, 140 – 10 x 300 - 11 x 350 - 10 x 495 – 10 x 660 – 45, 540/-**කි. (රු 28,040 යන වැටුප් පියවරට පෙරාතුව පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්වී සිටිය යුතුයි)

## *04* සාමාන්‍ය සුදුසුකම් :-

04.1 අයදුම්කරුවන් ශ්‍රී ලංකා පුරවැසියන් විය යුතුයි.

04.2 අයදුම්කරුවන් උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකි වන පරිදි ශාරීරික යෝග්‍යතාවයකින් සිටිය යුතුයි එමෙන්ම මනා චරිත.වත් පුද්ගලයකු ද විය යුතුයි.

04.3 අයදුම්කරුවන් උතුරු පළාතේ උපන් අය විය යුතුයි. අවම වශයෙන් අවුරුදු පහක් (05) ක් උතුරු පළාතේ අඛණ්ඩ පදිංචිකරුවන් විය යුතුයි. **(සම්මුඛ පරීක්ෂණයේ දී ස්ථිර පදිංචි සනාථ කිරීමට චන්ද නාම ලේඛනයේ උපුටනයක් ඉදිරිපත් කළ යුතුය්)**

04.4 අයදුම්කරුවන් අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට හෝ ඊට ප්‍රථම **සියලුම සුදුසුකම්** සපුරා තිබිය යුතුයි.

## 05. අධ්‍යාපන සුදුසුකම් හා අනෙක් සුදුසුකම් :-

**(අ)** (1) **අධ්‍යාපන සුදුසුකම් :-**

අ.පො.ස (සා/පෙ) විභාගයෙන් **එකවර භාෂාව** (දෙමළ/සිංහල), **ගණිතය** හා **කෘෂිකර්මය/විද්‍යාව** යන විෂයයන් ඇතුළුව විෂයයන් **හතරකට (04)** සම්මාන සාමාර්ථයන් සහිතව විෂයයන් හයක් (06) සමත්වී තිබිය යුතුයි.

**ඒ සමගම**

අ.පො.ස (උ/පෙ) විභාගයෙන් අවම **එක් (01)** විෂයයක් (පොදු පරීක්ෂණය හැර) සමත්වී තිබිය යුතුයි.

**හෝ**

**(2)** අ.පො.ස (සා/පෙ) විභාගයෙන් **එකවර භාෂාව** (දෙමළ/සිංහල), **ගණිතය** විෂයයන් ඇතුළුව විෂයයන් **හතරකට (04)** සම්මාන සාමාර්ථයන් සහිතව විෂයයන් හයක් (06) සමත්වී තිබිය යුතුය.

**ඒ සමගම**

ශ්‍රී ලංකාව තුළ අනුමත කෘෂිකර්ම විද්‍යාලක **මාස හයකට (06)** නොඅඩුව ලබා ගත් පුහුණු පාඨමාලා සහතිකයක් ලබා තිබිය යුතුයි.

**(ආ) වයස් සීමාව :-**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අයදුම්කරුගේ වයස අවුරුදු **දහඅට(18)**ට නොඅඩු හා අවුරුදු **තිහට(30)** නොවැඩි විය යුතුයි. ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි රජයේ සේවයක හෝ උතුරු පළාත් රාජ්‍ය සේවයේ තනතුරක් දරමින් සිටින නිලධාරීන්ට උපරිම වයස් සීමාව බලපාන්නේ නැත.

## 06. බඳවා ගැනීමේ ක්‍රමය:-

06.1 ලිඛිත විභාගයෙන් හා නිපුණතාවය පදනම් කරගෙන, බඳවා ගන්නා අවස්ථාවේදී බලගන්වා ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, බඳවා ගැනීමේ පරිපාටින්, ජාතික හා පළාත් ප්‍රතිපත්තීන් යනාදීන්ට අනුකූලව බඳවා ගනු ලැබේ. මෙම නිවේදනය මගින් කැඳවා ඇති සුදුසුකම් සියල්ල සම්මුඛ පරීක්ෂණයේදී පරීක්ෂා කරන අතර ඒ සඳහා ලකුණු පිරිනමන්නේ නැති අතර සම්මුඛ පරීක්ෂණයේ දී අවශ්‍ය සුදුසුකම් නැති බවට අනාවරණය වුවහොත් මෙම තනතුර සඳහා ඇති අයිතිවාසිකම් සියල්ල අහෝසි කරනු ලැබේ.

06.1 ඉහත පරිදි සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන්, ලිඛිත විභාගයෙන් සුදුසුකම් ලබන අපේක්ෂකයන් ලබා ඇති සම්පූර්ණ ලකුණු ප්‍රමාණයෙන් ඉහළ ලකුණු අනුපිළිවෙළ අනුව පත්වීම සඳහා සම්මුඛ පරීක්ෂණයට තෝරා ගනු ලැබේ.

06.2 පුරප්පාඩු වලින් *03%* ක් ආබාධිතයන් වෙනුවෙන් වෙන් කරනු ලැබේ. අපේක්ෂකයන් පත්වීම සඳහා තෝරා ගනු ලබන විට අදාළ තනතුරේ සේවය කිරීමට තම ආබාධිත තත්වය (Disability) බාධාවක් නොවන බවට විශේෂ වෛද්‍ය පරීක්ෂණය මගින් සනාථ කළ යුතුයි. එසේ නමුත් විශේෂ අවශ්‍යතාවයට යටත් වූ විභාග අපේක්ෂකයෙක් පත්වීමට සුදුසුකම් ලබන්නේ ලිඛිත පරීක්ෂණයෙන් සමත්වීමට අවශ්‍ය ලකුණු ප්‍රමාණය ලබා ගන්නා පදනම මතයි.

## 07. විභාග ගාස්තුව :-

අයදුම්කරුවන් පදිංචි උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක රුපියල් ***500.00*** ක් වටිනා මුදලක් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයාගේ තැන්පත් ගිණුම් අංකය වන ***"3401"*** ට ගෙවා මුදල් ගෙවූ කුවිතාන්සිය අයදුම්පත්‍රයේ නොගැලවෙන පරිදි අදාල කොටුවේ අලවා යොමු කළ යුතුයි. කුමණ හේතුවක් නිසා හෝ මෙම ගාස්තුව නැවත ගෙවනු නොලැබේ. එමෙන් ම මෙම ගාස්තුව වෙනත් කිසිදු විභාගයක් සඳහා මාරු කිරීමට ද අනුමත කරනු නොලැබේ.

## 08. අයදුම් කිරීමේ ක්‍රමය :-

08.1 මෙම දැන්වීම අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව A4 ප්‍රමාණයෙන් යුත් (සෙ.මී*21.*x සෙ.මී *29)* කඩදාසියේ *1* සිට 10 දක්වා වූ ඡේද පළමු කොටසේ ද, 11 සිට 15 දක්වා වූ ඡේද දෙවන පිටුවේ ද 16වන ඡේදය තුන්වන පිටුවේද ඇතුළත් වන පරිදි අයදුම්පත්‍රය සකස් කළ යුතුයි. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය **20.04.2021** වන දින හෝ ඊට ප්‍රථම ලබා ගත හැකි පරිදි, **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක:393/48, කෝවිල් වීදිය, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුයි.

08.2 අයදුම්පත්‍රය යොමු කරන ලිපි කවරයේ වම් උඩ කෙළවරේ **"උතුරු පළාත් ඉඩම් ක්ෂේත්‍ර උපදේශක IIIවන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - *2021*"**යනුවෙන් සඳහන් කළ යුතුයි. අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර හා අදාල තොරතුරු සම්පූර්ණ කර නැති අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08.3 අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් තම භාරයේ තබා ගැනීමට ප්‍රයෝජනවත් විය හැකිය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් හෝ පූර්ව නිශ්චිත පිටපත් භාර ගනු නොලැබේ. විභාග ප්‍රවේශ පත්‍ර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් නිකුත් කරනු ලැබේ. **විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම යනු අයදුම්කරුවන් සියලුම සුදුසුකම් සපුරා ඇති බවට අදහස් කිරමක් නොවන බව සැළකිය යුතුයි.**

08.4 අයදුම්පත්‍ර යොමු කර ඇති සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීමෙන් අනතුරුව පුවත්පත් නිවේදනයක් මගින් දැනුම් දෙනු ලැබේ. නිවේදන නිකුත් වී අවම වශයෙන් දින තුනකට (03) කට පෙරාතුව හෝ කිසියම් අයදුම්කරුවෙකුට විභාග ප්‍රවේශපත්‍ර නොලැබුණේ නම් පහත සඳහන් තොරතුරු සමග, **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක:393/48, කෝවිල් වීදිය, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට දැන්විය යුතුයි. (දුරකථන අංකය -021 221 9939, ෆැක්ස් අංකය -021 221 9940)

**සම්බන්ධ වන විට ඉදිරිපත් කළ යුතු තොරතුරු :-**

විස්තර සඳහන් ලිපියක්, අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් හා විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සියේ පිටපත, ප්‍රවේශ පත්‍රය යොමු කිරීමට අවශ්‍ය ෆැක්ස් අංකයක්

## 09. අනන්‍යතාවය සනාථ කිරීම :-

අපේක්ෂකයන් තමන් පෙනී සිටින සියළුම විෂයයන් සඳහා විභාග ශාලා අධීක්ෂණ නිලධාරී තෘප්තිමත් වන පරිදි තම අනන්‍යතාවය සනාථ කළ යුතුයි. අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් කුමක් හෝ එකක් පිළිගනු ලැබේ.

- (i) පුද්ගලයින් ලියාපදිංචි දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
- (ii) වලංගු ගුවන් බලපත්‍රය.
- (iii) වලංගු රියදුරු බලපත්‍රය

ඉහත සඳහන් ලියකියවිලි වලින් එකක් හෝ විභාගයට පෙනී සිටින විට ඉදිරිපත් කිරීමට අපොහොසත් වන විභාග අපේක්ෂකයෙකුගේ අපේක්ෂකත්වය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයාගේ අභිමතය පරිදි ප්‍රතික්ෂේප කළ හැකිය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් පනවනු ලබන නීතිරීතීන්ට අනුකූලව කටයුතු කිරීමට නැඹුරුවිය යුතුයි.

## 10. සාවද්‍ය තොරතුරු සඳහා දඬුවම් :-

අයදුම්පත්‍ර සම්පූර්ණ කරන විට අවධානයකින් යුතුව නිවැරදි තොරතුරු සැපයීමට වගබලා ගත යුතුයි. මෙම විභාග රීතීන්ට අනුව කිසියම් අයදුම්කරුවෙකු විභාගයට ප්‍රථමයෙන් හෝ විභාගයට පසුව හෝ කුමණ හෝ අවස්ථාවකදී හෝ සුදුසුකම් සපුරා නැති බවට අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය සඳහා ඇති හිමිකම් සියල්ල අහෝසි කරනු ලැබේ. එමෙන් ම අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද කිසියම් තොරතුරක් සාවද්‍ය තොරතුරු බව අනාවරණ වන කුමණ අවස්ථාවකදී හෝ පළාත් රාජ්‍ය සේවයෙන් නෙරපා හැරීමට අවස්ථාව ඇත.

## 11. අත්සන සහතික කිරීම :-

**සෑම අයදුම්කරුවෙකු විසින් ම තම අත්සන සහතික කර ගැනීම අත්‍යාවශ්‍ය වේ.** එක් රජයේ ආයතනයක් මගින් අයදුම් කරන අයදුම්කරුවෙකු වේ නම් තම ආයතන ප්‍රධානියා හෝ ඔහු වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු මගින් සහතික කර ගත යුතුයි. අනෙක් අයදුම්කරුවන් විසින් තම ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී, සාම විනිසුරු, දිවුරුම් ප්‍රකාශක නිලධාරී, නීතිඥ, නොතාරිස්වරයෙකු, නාවික හමුදාව, යුදහමුදාව, ගුවන් හමුදාව යනාදියෙහි අණ ලැබූ නිලධාරියෙකු, රුපියල් **498,960.00** ට නොඅඩු වටිනාකමක් වාර්ෂික ඒකාබද්ධ වැටුපක් වශයෙන් ලබන්නා වූ ස්ථිර රජයේ හෝ පළාත් පාලන හෝ පළාත් සභා නිලධාරියෙකු, ආගමික නිකායන් භාර ආගමික නායකයන් වැනි අයගෙන් කෙනෙකු සහතික කළ යුතුයි.

## 12. විභාග සැලැස්ම :-

මෙම විභාගය පහත සඳහන් පරිදි ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. දෙමළ මාධ්‍යයෙන් පැවැත්වීමට නියමිත මෙම විභාගයට සුදුසුකම් සපුරා ඇති සිංහල භාෂා මාධ්‍යය මගින් ද අයදුම්පත්‍ර යොමු වන විට මෙම විභාගය සිංහල මාධ්‍යයෙන් ද පැවැත්වෙන බව දන්වා සිටින අතරම අයදුම් කරන ලද භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අවස්ථාව දෙනු නොලැබේ.

| අංකය | ප්‍රශ්න පත්‍රය | විෂයය මාලාව | කාලය | ලකුණු |
|---|---|---|---|---|
| 01. | සාමාන්‍ය අභියෝග්‍යතාවය | මෙම ප්‍රශ්න පත්‍රය අයදුම්කරුවන්ගේ අවබෝධ කර ගන්නා හැකියාව හා ගැටළු සම්බන්ධයෙන් අනුමානය කරන ආකාරය, පරාවර්තනය දැකීම, ගණනය හා කාල පරතරය වැනි ප්‍රවීනතාවයන් ඇගයීම සඳහා සකස් කරන ලද ප්‍රශ්න පත්‍රයකි. | පැය *01* | *100* |
| 02. | සාමාන්‍ය දැනුම | මෙම ප්‍රශ්න පත්‍රය සමාජය හා සංස්කෘතිය, අධ්‍යාපනය හා දේශපාලනය, ආර්ථිකය හා පරිසරය යන විෂයයන් ගැන සමාජීය ජාතික හා ප්‍රාදේශීය හා ජාත්‍යන්තර වශයෙන් අයදුම්කරු සතුව ඇති දැනුම උරගා බැලීමට මෙම ප්‍රශ්න පත්‍රය සකස් කර ඇත. | පැය *01* | *100* |

මෙම විභාගය තරඟ විභාගයක් වන බැවින් පත්වීම සඳහා සුදුසුකම් ලැබීමට සෑම විභාග අපේක්ෂකයෙකුම එක් එක් විෂයයන් සඳහා වෙන් කරන ලද ලකුණුවලින් අවම වශයෙන් සීයයට හතලික ප්‍රතිශතයක් (40%) හෝ ලකුණු ලබා ගත යුතුයි. එසේ නමුත් අයදුම්කරුවන් ලබා ගන්නා සම්පූර්ණ ලකුණු ප්‍රමාණයෙන් ඉහළ ලකුණු අනුපිළිවෙළ අනුව ( Merit Order) පත්වීම් ලබා දීමට තෝරා ගනු ලැබේ.

13. විභාගය පැවැත්වීමට අපේක්ෂිත නගර හා එම නගරවලට අදාළ අංක,

| **නගරය** | **නගර අංක** |
|---|---|
| යාපනය | **01** |
| මන්නාරම | **02** |
| වවුනියාව | **03** |
| කිලිනොච්චිය | **04** |
| මුලතිව් | **05** |

එක් විභාග නගරයක් වෙනුවෙන් යොමු වෙන අයදුම්පත්‍ර වල සංඛ්‍යාව අඩු වූ අවස්ථාවක් වේ නම් මෙම විභාගය ආසන්නව ඇති නගරයේ පැවැත්වීමට කටයුතු කරනු ලැබේ.

14. විභාග අපේක්ෂකයන්ගේ විභාග ප්‍රතිඵල උතුරු පළාත් රාජ්‍ය සේවයේ ලේකම්වරයා විසින් www.np.gov.lk යන උතුරු පළාත් සභාවේ අන්තර් ජාලය මගින් නිකුත් කරනු ලැබේ. ඉන් අනතුරුව විභාගයට පෙනී සිටින අපේක්ෂකයන් හට තැපැල් මගින් ප්‍රතිඵල යොමු කරනු ලැබේ.

15. මෙම විභාගය පැවැත්වීම හෝ අවලංගු කිරීම සම්බන්ධයෙන් වූ බලතල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරයා සතුය. මෙම නිවේදනය දෙමළ හා සිංහල යන භාෂා මාධ්‍යයන් මගින් පළ කරන අතර භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් පැන නගින අවස්ථාවක් වෙතොත් එම අවස්ථාවේදී දෙමළ මාධ්‍යයේ නිවේදනය පරිදි කටයුතු කළ යුතුයි.

16. උක්ත විභාගය සම්බන්ධ නිවේදනය www.np.gov.lk යන උතුරු පළාත් සභාවේ අන්තර්ජාලය මගින් ලබා ගත හැකිය.

**S. තිරුවාකරන්.**
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත.
**30.03.2021**